# ශ්‍රී ලාංකීක අභිගුණ්ධීක ප්‍රජාවගේ පාරම්පරික සන්නිවේදන ක්‍රම හා ජනමාධ්‍ය බලපෑම

ඩී. එම්. ගංගා රාජිණී දිසානායක

FGS/03/02/06/2007/07

දර්ශනපති උපාධි පාඨමාලාව

වර්ෂ දෙදහස් දහයක් වූ නවම් මස

කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

ශ්‍රී ලංකාව

ප්‍රවේශ අංකය: 799

වර්ග අංකය:

# සාරාංශය

අභිගුණ්ඨිකවරු යනු ශ්‍රී ලංකාවේ ආදිවාසී ජන කොටසක් නොවන අතර අනාර්ය ඉන්දීය ප්‍රභවයක් ඇති සංචාරක ජීවිතයක් ගත කළ ජන කොටසකි. ඉන්දියාවේ සිට පැමිණ ලංකාවේ බස්නාහිර වෙරළතීරය ඔස්සේ රට මැදට ද ඊසාන දිග වෙරළ තීරය ඔස්සේ රට පහලට ද කණ්ඩායම් බෙදී ගමන් කරමින් තමන් විසින් නිශ්චය කරගත් ප්‍රදේශ කීපයක වැඩිපුර රැඳෙමින්, ජීවකාවේ යෙදෙමින් ලාංකිකයන් වශයෙන් ජීවිතය ආරම්භ කර ඇත. වර්ෂ 1989 දී කුඩාගම, ගල්ගමුව - අන්දරකැලේ, කලාඔය,අක්කරෙයිපත්තුවෙහි අලිකම්කම්බෙ යන ප්‍රදේශ කීපයක් මුල් කරගනිමින් එවක සිටි රජය විසින් අභිගුණ්ඨිකවරුහට ස්ථිර නිවාස, ඉඩම්, හා කුඹුරු ප්‍රදානයක් සිදුකර තිබේ.

වඩා යහපත් චේතනාවකින් යුක්තව කරන ලද මෙම ප්‍රදානයෙන් පසුව පරම්පරාවන් ගණනාවක් පුරා අභිගුණ්ඨිකවරු පවත්වාගෙන එන ලද සිය ජීවනරටාව කිසියම් බිඳ වැටීමකට ලක්විය. වෙනස් වූ ජීවන රටාවන් සමඟ බිඳියන්නට වූ අභිගුණ්ඨිකවරුන්ගේ පාරම්පරික විඥානය තවත් පලුදු කිරීමකට ලක්වන්නට වූයේ ජනමාධ්‍ය භාවිතයේ අවිධිමත් භාවය සමඟය. ජනමාධ්‍ය භාවිතයේ අවිධිමත්භාවය අභිගුණ්ඨිකවරුන්ගේ ඉඩමකට කොටු කරන ලද ජීවිතය සමඟ ලැබූ හුදකලාවේ තවත් එක් අතුරු ඵලයක් පමණි.

මෙම තත්ත්වය පිළිබඳව උක්ත සඳහන් ගම්මාන හතරෙහිම සහභාගිත්ව නිරීක්ෂණයන් ප්‍රමුඛ ක්‍රමවේදයන්ගෙන් රැස්කරගත් තොරතුරු ආශ්‍රයෙන් මා විසින් අභිගුණ්ඨිකවරුන්ගේ පාරම්පරික සන්නිවේදනය හා ජනමාධ්‍යයේ බලපෑම යන්න පිළිබඳව කරන ලද පර්යේෂණයේ විෂයානුකූල විවරණය මෙම වාර්තාව මගින් එළි දැක්වේ.

ජනාමාධ්‍ය භාවිතය යන්නට අභිගුණ්ඨිකවරුන් විසින් කරනු ලබන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් අධ්‍යයනයට ලක් කරනු ලැබූ අතර පාරම්පරික සන්නිවේදනය යන්නට අභිගුණ්ඨිකවරුන්ගේ වාචික, නිර්වාචික සන්නිවේදනයන් ඔවුන්ගේ 'තුලු' නම් ව්‍යවහාරය පදනම් කරගනිමින් සලකා බලනු ලැබීය.

අභිගුණ්කඨිවරුන්ගේ පාරම්පරික සන්නිවේදනය ජනමාධ්‍ය භාවිතා කිරීම තුළින් ඇති වී තිබෙන වෙනස හා නූතන ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය හා අභිගුණ්ඨිකවරු වැනි ජන කණ්ඩායම් පිළිබඳව ජනමාධ්‍ය සතු වගකීම ද ජනසන්නිවේදන විෂයානුබද්ධව මා විසින් මෙහි දී අධ්‍යයනයට ලක් කර ගත්තෙමි.

මෙම තත්ත්වයන් පිළිබඳව උක්ත සඳහන් ගම්මාන හතරෙහිම සහභාගීත්ව නිරීක්ෂණයන් ප්‍රමුඛ ක්‍රමවේදනයන්ගෙන් රැස්කර ගත් තොරතුරු ආශ්‍රයෙන් මවිසින් අභිගුණ්ඨිකවරුන්ගේ පාරම්පරික සන්නිවේදනය හා ජනමාධ්‍ය බලපෑම යන්න පිළිබඳව කරන ලද පර්යේෂණයේ විෂයානුකූල විවරණය මෙම වාර්තාව මගින් එළි දැක්වේ.

# Abstract

It is an accepted fact that Gypsies are not indigenous people of Sri Lanka, but a Community who had travelling life to Sri Lanka from India. who were not Aryans, who had emerged to the Central Part of the Country, through the western Coast, to the North East, and to the lower part of the Country paying more attention, to the areas they preferred, more to earn their live-hood as Sri Lankans in the year 1989 giving priority to villages, Such as Kudagama, Galgamuwa, Andarakele, Kalaoya, Akkaraipattu, the existing government at the time allocated permanent dwellings, land and fields to these gypsies.

Though done with a good motive behind allocation of these, it made the life style of the gypsies came to a stand. Still with change of the life style they seem to be fighting a losing battle to enhance their Social status. To which the Media held responsible and is answerable Because of the irresponsibility of the Media, these gypsies and their tribes were Confined to a set areas and the secluded life style added more to their downfall.

Taking these facts in to Consideration, and having researched four villages mentioned and on analyzing, the first hand information from derived the facts of Mass communication and effect of the Media is influence and the Research done is highlighted in this report.

The media sponsorship of the gypsies is highlighted on electronic and printed Media and taking facts in to Consideration, the verbal and the non verbal Communication, and is "Thulu" and therefore was taken in to Consideration Based on this.

It is Important to note the change that has come, and the role played, on the part of the Current Media, with regard to the tribes like the gypsies, and the responsibility of the Media and Communication which emphasized.

With regard to and considering these facts and with the Data collected these four villages and the mass Communication about the gypsies and the responsibility of the Media in accordance with them which is highlighted theoretically is forwarded in this research.